භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

පරිසර අමාත්‍යාංශය

ඇබෑර්තු - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

කොන්ත්‍රාත් පදනම

1992 අංක 33 දරන පතල් සහ ඛනිජ පනත මගින් පිහිටුවන ලද භූ විද්‍ය සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි පහත සඳහන් ඇබෑර්තු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම්

1. වරලත් ආයතනික ලේකම්වරයෙකු වීම හෝ
2. වරලත් ගණකාධිකාරීවරයෙකු වීම හෝ
3. නීතිඥවරයෙකු හා ලියාපදිංචි සමාගම් ලේකම්වරයෙකු වීම

පළපුරුද්ද

1. රාජ්‍ය හෝ පුද්ගලික ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස වසර 05 ක පළපුරුද්ද ඇතුළුව සහකාර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස අවම වසර 15 ක පළපුරුද්ද.
2. ඉහළ මට්ටමක නිවැරදිභාවයක් සමග නියමිත කාර්යයන් කාර්යක්ෂම ලෙස සම්පූර්ණ කිරීමට හැකි විය යුතුයි.
3. ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්හි චතුර භාවය සහ පරිගණක දැනුම
4. ස්වාධීනව වැඩකිරීමට සහ රහසිගත භාවය සැක විටකම පවත්වා ගැනීමට හැකි විය යුතුයි.

වයස් සීමාව : වයස අවු. 40 ට වැඩි සහ වයස අවු. 55 ට අඩු විය යුතුයි.

වැටුප : රු. 81,670 + අනුමත දීමනා

රැකියා වගකීම්

1. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මෙහෙයවීමේ ක්‍රියාපටිපාටි නියමිත ලෙස අනුගමනය කරන බව වගබලා ගැනීම සහ ආයතනයේ ක්‍රියාකාරීත්වයට බලපාන වගකීම්, රීති සහ රෙගුලාසි පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට මගපෙන්වීම සහ උපදෙස් දීම.
2. අධ්‍යක්ෂ මණ්ඩල ලිපිලේඛන සවිස්තරාත්මක සහ නිසි ලෙස සූදානම්ව ඇති බවට වගබලා ගැනීම.
3. සාකච්ඡා කිරීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල ලිපිලේඛන, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අවම වශයෙන් දින 05 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර නිසි ලෙස බෙදාහැරීමට වගබලා ගැනීම.
4. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවීම සහ ඒ සඳහා සහභාගි වීම, සුදුසු පරිදි රැස්වීම් වැඩ කටයුතු පිළිබඳ නිවැරදි කාර්ය වාර්තා පවත්වා ගෙන යාම.
5. අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු සඳහා ලේකම් ලෙස ක්‍රියා කිරීම.
6. විශේෂයෙන්, අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සකස් කිරීමේදී ආයතනයේ අභ්‍යන්තර සහ බාහිර උපදේශකයින්ගේ උපදෙස් සමග, ආයතනයේ ලැබිය යුතු ගිණුම් (AR) , ගිණුම් සහ අතුරු ප්‍රකාශයන් පළ කිරීම සහ බෙදා හැරීම සම්බන්ධීකරණය කිරීම.

තනතුරට අදාළ පොදු කොන්දේසි

- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ වැටුපෙන් 10% කින් සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායක විය යුතුයි. කාර්යාංශය මගින් සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා 15% ක් සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා 3% ක් ලබාදෙනු ඇත.
- රෝහල් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා හිමිකම.
- බාහිර රෝගී වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය සඳහා හිමිකම.
- අයදුම්කරු තහවුරු කර ගැනීම සඳහා ඇති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක අයදුම්පත්‍රයේ සඳහන් කර එවිය යුතුය.
- අධ්‍යාපනික සහ අනෙකුත් අදළ සහතිකවල ඡායා පිටපත්, අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුයි.

  අයදුම්පත්‍රය බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර 2022.02.24 වන දිනට පෙර පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් එවිය යුතුයි.

  තෝරා ගනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ඇත.

අධ්‍යක්ෂ ජෙනරාල්,
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,
නො : 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.